# සමුගැන්ම



හැරයන්නටයි  කාලය
හදේ මුල් ඇදි තණ බිම
යළිත් මේ ලී වැට මත
සවස්වරු නොගෙවෙනු ඇත

නික්මෙන්නටයි කාලය
විලෝ පෙළ නිල අතහැර
තවත්නම් නුඹලාහට
රහස් පවසන දින නැත
දුරයන්නටයි කාලය
සොඳුරු බිම පියමංකර

හඬන්නට ඉඩනැති ලොව
හඬනු හැරි මට රිසි ලෙස
ඉතින් සමුගනිමුද?
කතානොකරම හිඳිමුද?
මගේ සුසුම් එක්කර
විලෝ අත්තක බඳිමුද?

මලිති විජේසේකර




## හාදුව
**ජයන්ත නිමල් සිරි**

හඳුනගත් ගොඩක් කලකට පස්සෙ
තනි කමක් ළඟදි අපි
තනිවෙච්ච වෙලාවක
ඔබට දුන්...
ඔබෙන් මා වෙත ලැබුන...



වෙන් නොවූවද
කල්ප කාලෙකට,
දුරස් වෙන මොහොතකදි
මතක් වෙන්නට තිබුන...

ඒ අලුත් දවස් වල
ගෙයින් පිටවන මොහොතෙ
තකහනියෙ දුව ඇවිත්
තියා ගන්නට දුන්න...

අහිංසක පැටියන්ගෙ
ඇස්වලට වැලි ගසා
නොකැමැත්තෙ - කැමැත්තට
කැමැත්තෙන් ඉඩ දුන්න...

කනප්පුව මත
තේ පීරිසිය ඇල්මැරුණා
හොයයි උණුහුම,
ටික කලක සිට මග හැරුණා...

ලද මහන්සිය හිතකට නොගෙන,
පිරිමදින බත් බඳින
රෙදි දොවන හති අරින..
පිටව ගොස් සියල්ලන්
විත් ඉදිරි දොර වසන...

හීනෙකින් වත් මොකොට
නොමනාප*
ඒ දවස් වියපතට සින්න වුන...

www.boondi.lk

## අවුරුද්ද ඇවිදින්.....



සමුදුරෙන් එහා සිට
නැගෙන කොවුල් හඬ ඇසෙයි
ඉදෙන කිරිබතේ සුවඳ
හමන මදනල රැගෙන එයි
පදම රත්වූ පැණි තලිය
ආස්මියේ රටා දෙයි

කැවුමේ කොණ්ඩයෙ උසට
තෙල් බුබුළු පොර බදියි
තාච්චියෙ රස්නයට
දා බිංදු ගත පිරෙයි
සිවුරු පැහැ පනා කැන
කුස්සියේ හරි බරි ගැහෙයි
කරකැවෙන මැසීමෙ සක
අලුත් ඇඳුමක හැඩ බලයි

බිත්තියේ හුණු සුවඳ
නාස් පුඩු පුරවලයි
නැවුම් දොර ජනෙල් තිර
තාලයට ගත පද්දවයි
අත අගේ ඔන්චිලි
අහස අතගා බලයි

නෑසියන් බැහැ දකිනු සේ
බුලත් අත  පේවෙතෙයි
යටගිය දවසෙ වූ
කෝනතර අද අමතකයි
රක්ත පැහැ එරබදුව
පෙති විදහා සිනහසෙයි
මල්පිරී එල පිරි තුරු
මහා මඟුලක සිරි මවයි

අවුරුද්ද ඇවිදින්ලු එහෙ
රතිඤ්ඤා හඬ සන් කරයි
මගේ සිත මට හොරෙන්
මගෙ රටට ඉගිළි යයි

ප්‍රසාදිනි වෙත්තසිංහ
මිල්පාක්

## බෝ සමිඳු සෙත් කවි

සම්බුදු, හිමිට සෙවනක් මුල, බෝ   රජු   ට
මේ මල් පුදන්නේ, සමිඳුන්ගේ   නම   ට
බුදු හිමි කියා, දුන්නේ මහ ගුණ   කඳ   ට
පළමුව වඳිමි, බෝ සමිඳුන්ගේ,   නම   ට
සාධු ! සාධු ! සාධු !

බුදු පුද ලබා, ගත් සොඳ මේ, බෝ   රුක   ට
මේ පුද කරන්නේ, පිළියෙල, කර   සොඳ   ට
සියළුම අපල, දුර කරවා, දෙන   ලෙස   ට
සහනය සලසන්න, බෝ රජුනේ   මෙම   ට
සාධු ! සාධු ! සාධු !

අන්තිම සැපයි, බෝ සමිඳුගේ සෙවන   ම   ට
මම අසරණයි, වෙන්නකො, සමිඳුනෙ   පිහි   ට
සියළුම අපල දුරු කරවා, දෙන   ලෙස   ට
වැඳ වැඳ, කියමි පින් ඇති බෝ,   සමිඳුන්   ට
සාධු ! සාධු ! සාධු !

දෙවියන් බමුන්, වඳිනා පුදනා,   බෝ   දී
කොපමණ වැඳුම්, පිදුවත් මගේ, සිතට   ම   දී
දැල්වෙන පහන්, අලෝකය, සිතෙහි   රැ   දී
බුදු හිමි පෙන්වා, දෙනෙතට, බෝ   මැඩ   දී
සාධු ! සාධු ! සාධු !

බෝපත් පවන්, සිලි සිලි හඬ, ඇසෙන   වි   ට
මට සිහිවෙන්නෙ, බෝ සමිඳුන්ගේ,   සතු   ට
ඉඳ වැලි තලාවේ, බෝ මැඩ සෙවන   ය   ට
තෙල් මල් පුදා, වඳිනෙමි බෝ, සමිඳුන්   ට
සාධු ! සාධු ! සාධු !

බෝ සමිඳුන්ගෙ, මහ ගුණ කඳ, මෙනෙහි කො   ට
මගෙ දුක කියන්නේ, සමිඳුගෙ, සෙවන   ය   ට
සිසිලක් වෙලා, මගෙ දුක නිවනා,   ලෙස   ට
අයැබ නැමද, මේ ලෙස බෝ, සමිඳුන්   ට
සාධු ! සාධු ! සාධු !

මඳ සුළඟට, ලෙලදෙන බෝපත්, සෙව   නේ
ඉඳගෙන කියමි, මට පිහිටක්, වන ලෙසි   නේ
මහමෙව්නා, උයනේ, රෝපිත, බෝ රජු   නේ
මට සිසිලක්, ගෙන දේ මේ, බෝ සෙව   නේ
සාධු ! සාධු ! සාධු !

සිලි සිලි හඬ, ඇසෙන විට බෝ, සෙවන   යට
ගෙන දේ සහනේ, මාගේ මේ අපලය   ට
සිටිනා විටදි, බෝ සමිඳුගෙ, සෙවන   ය   ට
මගෙ දුක නිවෙයි, ලැබෙමින් සමිඳුගෙ,   පිහි   ට
සාධු ! සාධු ! සාධු !

බුදු හිමි වෙතින්, පුද ලැබූ මහ, බෝ   සමි   දේ
තේජස් බවක්, ඇති බව වැටහෙයි,   නිබ   දේ
පිහිටක් අයැද, මා අද, කරදර   මැද්   දේ
බෝ සමිඳුටයි, මගේ දුක, කියලා   වැන්   දේ
සාධු ! සාධු ! සාධු !

ප්‍රේමසේන ලුණුගම
විශ්‍රාමික විදුහල්පති - සාමවිනිසුරු

# අලුත් පොත්

## හිම බිමේ සුදු රෝස




ආචාර්ය විද්‍යානි මනතුංග සන්නස පාඨකයනට අමුතුවෙන් හඳුන්වාදිය යුතු නැති ලේඛිකාවකි. විද්‍යානි සන්නස පුවත්පතට කොටස් වශයෙන් ලියූ "හිම බිමේ සුදු රෝස" නවකතාව දැන් පොතක් වශයෙන් මුද්‍රණයෙන් නිකුත් වී ඇත .

ළහිරු නම් වන ශ්‍රී ලාංකික තරුණයාත් ටානයා නම් ඔස්ට්‍රේලියානු යුවතියත් අතර දෝලනය වන "හිම බිමේ සුදු රෝස" නවකතාව ඉතා රසවත් එකකි.

පොත ගෙන්වාගැනීම සඳහා ඔබට පහත සඳහන් ඊමේල්  ලිපිනයෙන් විද්‍යානි සම්බන්ධ කර ගත හැකි ය.
vidyanim@yahoo.com.au

"හිම බිමේ සුදු රෝස" නවකතාව පිළිබඳව රසික සූරියාරච්චි කරන විග්‍රහය ළබන කළාපයේ බලාපොරොත්තුවන්න




## දොස්තර වෙකෝෆ් සහ ගුණදාස අමරසේකර සංවාද

ආචාර්ය පාලිත ගනේවත්ත ශූරීන්ගේ නවතම පොත් දෙකක් නිකුත් වී ඇත.

ඔහු එස්බීඑස් ගුවන් විදුලිය වෙනුවෙන් මහ ගත් කතුවර ගුණදාස අමරසේකර ශූරීන් සමග කළ සංවාද මාලාවක් " ගුණදාස අමරසේකර සංවාද" නමින් විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රයේ ප්‍රකාශනයක් ලෙස නිකුත් වී ඇති අතර ඇන්ටන් වෙකෝෆ් ලේඛකයාගේ සාහිත්‍ය නිර්මාණ කෙරෙහි ඔහුගේ වෛද්‍ය වෘත්තියේ බලපෑම සාකච්ඡා කෙරෙන "දොස්තර වෙකෝෆ්" කෘතිය ගොඩගේ ප්‍රභාශනයක් ලෙස ද එළි දක්වා ඇත.



පොත් දෙකේම පිටකවර නිර්මාණය කර ඇත්තේ මෙල්බන්හි විජය කරුණාසේන මාධ්‍යවේදියාය.

pganewatta@gmail.com ඊමේල් ලිපිනයෙන් ඔබට පාලිත හා එක් විය හැකි ය.